**ශීර්ෂය - 413 - මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය**,** එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 16 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

මුදල් හා ප්‍රාග්ධන වෙළඳපොළ හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 06 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

---

**2.1 වියදම් කළමණාකරනය**

---

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රතිපාදන මාරු කිරීම (මු.රෙ.66) | | |
| (i) සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන හා මූලධන වියදම් වැය විෂයය 18 ක මූලික ඇස්තමේන්තු හා සංශෝධිත ඇස්තමේන්තු අතර සියයට 99 සිට සියයට 433 දක්වා පරාසයක විචලතාවයක් නිරීක්ෂණය විය. | මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය යටතේ 2020 ජනවාරි සිට අගෝස්තු දක්වා වැය ශීර්ෂ 104, ආර්ථික ප්‍රතිපත්ති සංවර්ධන අංශය යටතේ වැය කරන ලද වියදම් ගිණුම්ගත කිරීම සඳහා එම අංශයට අදාල ප්‍රතිපාදන වැරදීමකින් මෙම අමාත්‍යාංශ වැය ශීර්ෂයට අන්තර්ගත කර තිබූ අතර, මෙම අමාත්‍යාංශ ලේකම්ගේ අංක SMMCM/FIN/02/02/01 හා 2020/11/17 දිනැති ලිපියෙහි (ඇමුණුම් I) දැනුම් දීම පරිදි අංක 06/2020 හා 2020/11/30 දිනැති මුදල් අමාත්‍යාංශ අයවැය චක්‍රලේඛය අනුව වියදම 102 වැය විෂය යටතේ ගිණුම් ගත කිරීමට කටයුතු කරන ලෙස දන්වා තිබූ අතර, එම ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව කාරුණිකව දැනුම් දෙමි. | වාර්ෂික ඇස්තමේන්තු තාත්වික හා ඵලදායී ලෙස සකස් කිරිමට අවශ්‍ය පියවර ගැනීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නිෂ්ඵල වූ ප්‍රතිපාදන<br><br>මූලධන වැය විෂයයන් 3 ක් හා පුනරාවර්තන වැය විෂයයන් 3 ක් සඳහා වාර්ෂික අයවැයෙන් වෙන්කර තිබූ මුළු ප්‍රතිපාදනය වූ රු. 2,540,000 ක් සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. | මෙම රාජ්‍ය අමාත්‍යාංශය 2020 අගෝස්තු මස පිහිටුවන ලද අතර, ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් තීරණය කරන ලද ඇස්තමේන්තුවක් මෙම මාස 05 සඳහා ලබා දී ඇති අතර එබැවින් ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව කාරුණිකව දැනුම් දෙමි. | වාර්ෂික ඇස්තමේන්තු මඟින් අධි ප්‍රතිපාදන සලසා ගැනීම පාලනය කළයුතු වීම. |
| (ඇ) | අධි ප්‍රතිපාදන සලසා ගැනීම<br>සමාලෝචිත වර්ෂයේදි වැය විෂයයන් 17 ක් සඳහා රු. 16,820,000 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු රු. 8,221,133 ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 28 ක සිට සියයට 84 ක පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | මෙම රාජ්‍ය අමාත්‍යාංශය 2020 අගෝස්තු මස පිහිටුවන ලද අතර, ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් තීරණය කරන ලද ඇස්තමේන්තුවක් මෙම මාස 05 සඳහා ලබා දී ඇති අතර එබැවින් ප්‍රතිපාදන ඉතිරි වී ඇත බව කාරුණිකව දැනුම් දෙමි. | වාර්ෂික ඇස්තමේන්තු මඟින් අධි ප්‍රතිපාදන සලසා ගැනීම පාලනය කළයුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

**3.1.1 සැලසුම් කිරිම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය 2020 අගෝස්තු 12 වන දින පිහිටුවා තිබූ අතර, 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සහ කාර්යසාධන වාර්ථාව පිළියෙල කර නොතිබුණි. | මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය 2020 අගෝස්තු 12 වන දින පිහිටුවන ලද අතර ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් හා ප්‍රමාණවත් කාලයක් නොමැති වීම හේතුවෙන් 2020 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සහ කාර්යසාධන වාර්තාවක් පිළියෙල කිරීමට නොහැකි වූ බව කාරුණිකව දැනුම් දෙමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කලයුතුවීම. |